www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ප්‍රන්ස ජනාධිපතිවරනය මුවවිට

On the eve of the French presidential election

**2017 මැයි 06**

මැයි 7 දා ප්‍රන්සයේ කෝටි ගනන් ජනතාව ජනාධිපති තරගයේ දී ඡන්දය දෙනු ඇත්තේ පෙර නුවූ විරූ දේශපාලන අර්බුදයක් මැද්දෑවේ ය; ප්‍රජාතන්ත්‍ර අයිතීන් තහනම් කරන හදිසි තත්වයක් මැද ය. සෝශලිස්ට් පක්ෂය (පීඑස්) සහ රිපබ්ලිකන් පක්ෂය (එල්ආර්) යන ප්‍රන්සයේ අපකීර්තියට පත්ව ඇති සාම්ප්‍රදායික ධනපති පක්ෂ දෙකේ අපේක්ෂකයෝ, ප්‍රථම වටයේදී ම පරාජයට පත්ව තරගයෙන් බැහැර කරනු ලැබ සිටිති. කෙසේ වෙතත්, ජන්ද දායකයින්ට මුහුන දීමට සිදුවී තිබෙන තෝරා ගැනීම රටේ පාලක පැලන්තිය කෙරේ එල්ල වන්නාවූ නිරුත්තර චෝදනාවකි.

එක පසෙකින්, දෙවන ලෝක යුද සමයේ ප්‍රන්සය අල්ලාගත් ජර්මානු නාසීන් සමග සහයෝගී වූ පාලන තන්ත්‍රයේ උරුමක්කාරියක වන ප්‍රන්ස නව ෆැසිස්ට්වාදී පෙරමුනේ (එෆ්එන්) මරීන් ලපෙන්ය. යුද්ධයේ සහ ආරක්ෂනවාදයේ ජාතිකවාදී "පලමුව ඇමරිකාව" වැඩ පිලිවෙල කරපින්නා ගත් ඩොනල්ඩ් ට්‍රම්ප් බලයට පත්වීම හුවා දක්වන ඇය කියා සිටින්නේ, ප්‍රන්සය තම ප්‍රධාන වානිජ හවුල්කරුවා වන ජර්මනියට උපරිම ආර්ථික පාඩු සිදුවන පරිද්දෙන්, යුරෝපිය සංගමය ද යුරෝ මුදල ද අතහැර දැමිය යුතු බව ය.

ෆැසිස්ට්වාදී පොලිස් ඒකාධිපතිත්වයක් ගොඩ නැගීම පිනිස ආගමනය තහනම් කොට, මහා පරිමාන කඩා පැනීම් සිදුකරමින් ද ප්‍රන්ස නොවන දරුවන්ට නිදහස් අධ්‍යාපනය අහෝසි කිරීම සඳහා ද ඇය, රට තුල සෝෂලිස්ට් පක්ෂ ආන්ඩුව විසින් පනවා තිබෙන හදිසි තත්වය ද මහා පරිමාන චර බුද්ධි ජාලය ද යොදා ගනු ඇත.

ජනපතිවරනය දිනනු ඇතැයි අපේක්ෂිත, පීඑස් සංවිධානයේ සහය ලබන ල පෙන් ගේ ප්‍රතිමල්ලවයා වන, බැංකුකරු එමානුවෙල් මක්‍රෝං, එෆ්එන් සංවිධානය ට විකල්පයක් වන්නේ නැත. ජර්මානු පාලනයේ ද ඇමරිකානු ඩිමොක්‍රටික් පක්ෂයේ ද සගයෙකු වන මක්‍රෝං සිරියාවට, උතුරු කොරියාවට සහ රුසියාවට එරෙහිව නැටෝව ගෙන යන න්‍යෂ්ටික යුද්ධයක් අවුලුවාලීමට මග පාදනු ඇති යුද ව්‍යායාමයට සහය දෙන අතර තරුනයන් යුද්ධයට බලෙන් බඳවා ගැනීම සඳහා පෙනී සිටී. ඔහු සැලසුම් කරන්නේ, පීඑස්හි චෛරයට පාත්‍රව ඇති කම්කරු නීති ද ඇතුලුව, රට තුල හදිසි තත්වය කෙසේ හෝ පවත්වා ගනිමින්, 20 වන සියවසේ පරම්පරා ගනනාවක් පුරා යුරෝපිය කම්කරුවන් ගේ අරගල තුලින් දිනාගනු ලැබූ, පොදු සෞඛ්‍ය සහ විශ්‍රාමික සමාජ ගිවිසුම් සහ සමාජ අයිතීන් අහෝසි කර දැමීමට ය.

මේ කුමන අපේක්ෂකයා ජයග්‍රහනය කලත් ප්‍රන්සයේ පාලනය පවතිනු ඇත්තේ, මූල්‍ය ප්‍රාග්ධනයේ ආසක්තයන් නියෝජනය කරන රට තුල පන්ති යුද්ධය ද දේශ සීමාවෙන් පිටත අධිරාජ්‍ය යුද්ධය ද සහිත වැඩ පිලිවෙලක් වෙනුවෙන් කැපවීගත් ආන්ඩුවක් යටතේය. ඉදිරිපත්ව ඇති අපේක්ෂකයන් කෙරේ ජන්දදායකයන් හතකින් තුනක් කෝපයට පත්ව ඉන්නා තතු තුල ප්‍රන්සය සහ යුරෝපය හරහා විප්ලවකාරී පරිමාවක පන්ති අරගලය සැකසෙමින් තිබේ! ස්ටැලින්වාදීන් විසින් සෝවියට් සංගමය විසුරුවා හරිනු ලැබීමෙන් පසුව ගතව ඇති සියවස් කාලක යුද්ධය සහ යුරෝ සංගමය පැටවූ කප්පාදු වලට ඉක්බිතිව දැන්, ප්‍රන්ස ජනයා ගෙන් තුනෙන් දෙපංගුවක් පන්ති අරගලය ජීවිතයේ දෛනික යථාර්ථය බවට පත්ව ඇති බව කියා සිටිති. 2008 වෝල් වීදියේ බිඳවැටීමත් සමග පටන් ගත් ආර්ථික අර්බුදය හැර අන් කිසි දෙයක් නොදන්නා තරුන ජනකාය අතර නිසැකවම විප්ලවවාදි මානසිකත්වයක් ගොඩ නැගෙමින් ඇත.

මෑතකදී යුරෝපීය සංගමය විසින් කරන ලද "Generation What" පරම්පරාව කුමක් ද නමැති විමර්ශනයේ දී, වයස 34 ට අඩු ප්‍රන්ස ජාතිකයින් සියයට 61 ද ඇතුලු යුරෝපීය තරුනයන් ලක්ෂ ගනනක් කියා සිටියේ, දේශපාලන පර්යායට එරෙහිව "මහා පරිමාන නැගිටීමකට" සම්බන්ධ වීමට තමන් කැමති බවය. බ්‍රිතාන්‍යය, ස්වීඩනය, නොර්වේ, ෆින්ලන්තය, ඉතාලිය ග්‍රීසිය, පෘතුගාලය, හංගේරියාව, බල්ගේරියාව, සහ රොමේනියාව යන රටවල සියයට 6 0ට වැඩි පිරිසක් ද ඊට එකඟ වූහ.

ඉරිදා පැවත්වෙන ජන්ද විමසීමේ දෙවන වටයේ දී චන්දය දීම ක්‍රියාශීලිව ප්‍රතික්ෂේප කරන ලෙස හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රන්ස ශාඛාව වන සමාජවාදී සමානතා පක්ෂය, (පාර්ටි ඩි ලිගලිතේ සෝෂලිස්තේ - පීඊඑස්) කියා සිටී. මෙය පුද්ගලවාදී ලෙස ජන්දය දීමෙන් වැලකී සිටීම සඳහා කෙරෙන කැඳවුමට වඩා බෙහෙවින් වෙනස්ය.

අපේක්ෂකයන් දෙපලට ම විරුද්ධව කම්කරුවන් හා තරුනයින් අතර පවතින මනෝ භාවය හමුවේ පීර්එස් ඉල්ලීම පාදකවන්නේ, අති මූලික දේශපාලන මූලධර්ම මත වේ. ධනේශ්වර පක්ෂයක් සමග මැතිවරන ගිවිසුම් වලට එළඹීමේ මාරක විපාක ශතවර්ෂයකින් ඔබ්බට දිවෙන ජාත්‍යන්තර පන්ති අරගලයේ සමස්ත අත්දැකීම විසින් දේශපාලනිකව විද්‍යමාන කර ඇත. වඩාත් ප්‍රතිගාමී යයි සැලකුනු එක් පක්ෂයක ජයග්‍රහනය වැලැක්වීම සඳහා කම්කරු පන්තිය, මූල්‍ය ප්‍රාග්ධනයේ ප්‍රතිගාමී පක්ෂ වලින් තවත් එකකට යටත් කිරීම මග පාදා ඇත්තේ, දේශපාලන ව්‍යසනයකට ය. මේ වතාවේදී ද එය එසේ වනු ඇත. එවන් දේශපාලනයකට දේශපාලන තර්කනයක් ඇත.

මක්‍රොං මැතිවරනය ජයග්‍රහනය කලහොත් කම්කරුවන්ට කියා සිටිනු ඇත්තේ, ෆැසිස්ට්වාදීන් බලය අල්ලාගනු ඇති නිසා ඔහුගේ ආන්ඩුව පරාජය කිරීමට හෝ පෙරලා දැමීමට සටන් නොකල යුතු බවය.

කම්කරු පන්තිය මුහුන දී සිටින දේශපාලන අර්බුදය විසඳා ලීමට සමත් දක්ෂ මැතිවරන උපායවල් ඇත්තේ නැත. ඡන්දය දීමෙන් වලකින ලෙසට කරනු ලබන කැඳවුම නිවැරදි වන්නේ එය කම්කරු පන්තියේ දේශපාලන විඥානය ඉහල දමා ඉදිරියේ එන අරගලවලට ඔවුන් සූදානම් කරන හෙයිනි.

මුඛ්‍ය කාරනය වන්නේ, ඉදිරියේ එන මෙම අරගලයන් සඳහා කම්කරු පන්තිය තුල විප්ලවවාදී නායකත්වය ගොඩනැගීමට අවශ්‍ය වන්නාවූ මාක්ස්වාදී, ජාත්‍යන්තරවාදී ඉදිරිදර්ශනයක් සම්පාදනය කිරීම යි.

ශොන් -මරී ල පෙන් සහ ජැක් චිරාක් අතර 2002 ප්‍රන්සයේ ජනපතිවරනයේ අවසන් වටය සිදුවූ අවස්ථාවේදී බොහෝ කම්කරුවන් එළඹුනු නිගමනය නම්, පීඑස් සමග ඇඳුනු ඊනියා "අන්ත වම" ද ඇතුලු පක්ෂ ෆැසිස්ට් එෆ්එන් වැලැක්වීම සඳහා යයි දක්ෂිනාංශික අපේක්ෂකයෙකු පිටිපස එනම් ජැක් චිරාක් පසුපස ගාල් වූ අන්දමයි. එහි විපාකය වුනේ, කම්කරු පන්තියට එරෙහි ප්‍රහාරය උග්‍ර වීම ද සාම්ප්‍රදායික පාලක පක්ෂ තවදුරටත් දකුනට හැරීම ද නව-ෆැසිස්ට් බලපෑම දිගින් දිගටම වැඩි වීමත් ය.

මෙම ඡන්ද විමසීම ද එයට උපත දුන් සකල ප්‍රතිගාමී රාමුව ම ද ප්‍රතික්ෂේප කිරීම අත්‍යවශ්‍ය වේ. කම්කරු පන්තිය ඉරිදා අවසන් වටය ක්‍රියාත්මකව වර්ජනය කිරීමෙන් පටන් ගෙන තමන්ගේ ම ස්වාධීන දේශපාලන විකල්පය ඉදිරිපත් කරගත යුතු වේ.

ජින්-ලූව් මෙලන්ෂොන් ගේ අන්සබ්මිසිව් ෆ්‍රාන්ස් සහ නිව් ඈන්ටි කැපිටලිස්ට් පාර්ටි වැනි කන්ඩායම්, "අඩු නපුර" තර්කයට යටත්ව මක්‍රොං කෙරේ වමෙන් එල්ලවන විප්ලවවාදී විකල්පය වලක්වා ලීමට ක්‍රියා කරන බව පීර්එස් අනතුරු අඟවයි. ජනපතිවරනයේදී මෙම ව්‍යාජ -වාම කාන්ඩවල ආස්ථානය ඉටු කරනු ඇත්තේ, සංස්ථාපිතයට එරෙහි එකම පක්ෂය ලෙස ඉදිරිපත් වීමට නව - ෆැසිස්ට්වාදීන් දරන ප්‍රයත්නයට උල්පන්දම් දෙමින්, මක්‍රොං බලයට පත් ව තම කම්කරු විරෝධී පිලිවෙත් ක්‍රියාත්මක කරන තතත්වයක් තුල නව - ෆැසිස්ට්වාදීන් ගේ අධිකාරය වැඩි කර ගැනිමට උදව් වීම යි.

මෙලන්ෂොන් ගේ ආස්ථානය වනාහි දේශපාලන වගකීම බියගුලු ලෙස හැර දැමීමකි. ඔහුට සමස්ත ඡන්දවලින් සියයට 20ක් ලැබුනි. එහෙත් මක්‍රොං එළිපිට සහය දීම, තමන්ගේ ම ඡන්දදායකයින් ඉදිරියේ තමන් අපකීර්තියට පත් කරනු ඇතැයි දන්නා මෙලෙන්ෂොන් කරන්නේ, මක්‍රොං සහ ල පෙන් යන දෙදෙනාටම විරුද්ධව කම්කරු පන්තිය බලමුලුගැන්වීම වැලක්වීමට තමන්ට හැකි සෑම දෙයක්ම කිරීමයි. සංවිධානය ජුනි මස පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරනයට ඉදිරිපත් වීම අඟවමින්, තමා මක්‍රොංගේ අගමැතිවරයා වීමට සූදානම් බව ඔහු කියා සිටී.

දේශීය පිලිවෙත අධීක්ෂනය කිරීමට ද මහා යුද සන්නද්ධයක ට තමා සූදානම් බව ද පෙන්නුම් කරන මෙලන්ෂොන් ගේ ප්‍රකාශය පෙන්නුම් කරන්නේ, ඔහුගේ යුඑෆ් සංවිධානය සාමය සහ සමාජ සමානාත්මතාවය සොයන ඡන්ද දයාකයින්ට ආවෘත අන්තරයක් බවයි.

සොෂලිස්ට් සහ රිපබ්ලිකන් පක්ෂ වටා වූ පැරනි දේශපාලන රටාව බිඳවැටෙත් ම කම්කරු පන්තියට ඉතිරිව ඇති එකම මාර්ගය නම්, සොෂලිස්ට් පක්ෂය (පීඑස්) සහ එහි වාටිය අත හැර විප්ලවවාදී මාවතට ප්‍රවිෂ්ට වීමයි. ප්‍රන්ස දේශපාලන සංස්ථාපිතයේ ආවෘත අන්තරය පදනම් වී ඇත්තේ, යුද්ධය සහ ඒකාධිපතිත්වයේ පාතාලයට ඇද වැටෙමින් පවත්නා ලෝක ධනේශ්වර පර්යායේ මරනීය අර්බුදය මතය.

සෝෂලිස්ට් පක්ෂයටත්, මක්‍රොංට සහ ෆැසිස්ට් එෆ්එන් සංවිධනයට එරෙහිව ප්‍රති ප්‍රහාරයක් දියත් කිරීම සඳහා කම්කරු පන්තියට, තමන්ගේ ම පක්ෂය සහ දේශපාලන නායකත්වය අවශ්‍ය වේ. ඔක්තෝබර් විප්ලවයේ මේ ශත සංවත්සරය තුලදී ප්‍රන්සයේ සමාජවාදී සමානතා පක්ෂය (පීර්එස්) ඉදිරිපත් කරන්නේ, 1917 රුසියානු විප්ලවය තුල ලෙනින්ගේ සහ ට්‍රොට්ස්කිගේ බෝල්ෂෙවික් පක්ෂය සටන් කල සමාජවාදී සහ ජාත්‍යන්තරවාදී ක්‍රියා මාර්ගයයි. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව විසින් සුරකිනු ලබන ට්‍රොට්ස්කිවාදයේ උරුමයයි. එය ජනපතිවරනය පිලිබඳ මෙම විශ්ලේශනය සමග එකග වන කම්කරුවන්ට සහ තරුනයන්ට ආයාචනය කරන්නේ, මෙම ක්‍රියාමාර්ගය අධ්‍යයනය කර ප්‍රන්සයේ කම්කරු පන්තියේ පෙරටු බල ඇනිය ගොඩ නැගීමට ඉදිරිපත්වන ලෙසයි.

ඇලෙක්ස් ලැන්ටියර්

© www.wsws.org